සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**08 ශ්‍රේණිය** **තෙවන වාර පරීක්ෂණය - 2024** **50 S I,II**

**නම: ..........................................** **නාට්‍ය හා රංගකලාව** **කාලය පැය දෙකයි**

**★ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
**★ ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) ළමා නාට්‍යය,
1. තාරුණ්‍යයේ ස්වභාවය ඉදිරිපත් කරනු ලබයි. 2. ළමා ලෝකය නිරූපණය කරනු ලබයි.
3. ළමා චරිත පමණක් ඉදිරිපත් කරනු ලබයි. 4. වැඩිහිටියන් විසින් ළමයින් සඳහා ඉදිරිපත් කරනු ලබයි.

02) සාන්තුවර සෙබලානෝ නාට්‍යය,
1. හෙන්රි ජයසේන මහතාගේ ය. 2. රංජිත් ධර්මකීර්ති මහතාගේ ය.
3. සුගතපාල ද සිල්වා මහතාගේ ය. 4. බන්දුල ජයවර්ධන මහතාගේ ය.

03) මනසින් යමක් මවාපෑම,
1. පරිකල්පනය වේ. 2. අභිරූපණය වේ.
3. සමාරෝපණය වේ. 4. ස්ථානෝචිත ප්‍රඥාව වේ.

04) කටහඬ අභ්‍යාස කිරීම සඳහා යොදාගත හැකි ග්‍රන්ථයක් වන්නේ,
1. බයිබල යි. 2. ගුත්තිල කාව්‍යය යි.
3. සකස්කඩ යි. 4. පන්සිය පනස් ජාතක පොත යි.

05) වේදිකා නාට්‍යයක නළුවන් තෝරා ගැනීම,
1. නලුවරණය නම් වේ. 2. නලු වරම නම් වේ.
3. රංග අභ්‍යාස නම් වේ. 4. රංග ප්‍රතිභාව නම් වේ.

06) නළුවෙකු චරිතයකට ප්‍රවේශ වීම හඳුන්වන්නේ,
1. සමාරෝපය ලෙස ය. 2. අනුකරණය ලෙස ය. 3. අභිරූපණය ලෙස ය. 4. රූපණය ලෙස ය.

07) නළුවෙකු විසින් ගයනු ලබන ගීත අයත් අභිනය වන්නේ,
1. ආංගික අභිනය යි. 2. වාචික අභිනය යි. 3. සාත්ත්වික අභිනය යි. 4. ආහාර්ය අභිනය යි.

08) නාට්‍යයක තිබිය යුතු අත්‍යවශ්‍ය අංගයකි.
1. ගැටුම 2. ගීත 3. හාස්‍යය 4. නර්තනය

09) චුල්ල ධනුද්ධර ජාතකය ඇසුරින් නිර්මාණය වූ නාට්‍යය වන්නේ,
1. සිංහබාහු නාට්‍යයි. 2. සඳකිඳුරු නාට්‍යයි. 3. කදාවළලු නාට්‍යයි. 4. මනමේ නාට්‍යයයි.

10) නාට්‍ය පෙළ රචනය ,
1. අධ්‍යක්ෂකගේ කාර්යයකි. 2. පිටපත් රචකයාගේ කාර්යයකි.
3. නළු නිළියන්ගේ කාර්යයකි. 4. වේදිකා පරිපාලකගේ කාර්යයකි.

**★ අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට අදාළව දී ඇති වගන්ති හරි නම් ( ✔ ) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

11) වෙද පුටුව රංග අභ්‍යාසයකි. ( )

12) අභිරූපණ රංගනයක දී වාචික අභිනය ප්‍රබලව යොදා ගනී. ( )

13) නාට්‍ය පිටපත පෙළ නමින් හඳුන්වයි. ( )

14) නලු නිළියන්ගේ රංගනය අභිබවා සංගීතය මතුවිය යුතු ආකාරයට නාට්‍ය සංගීතය යොදාගත යුතුය. ( )

15) ලෝක ධර්ම හා නාට්‍ය ධර්ම යනු නාට්‍ය ශෛලීන්ය . ( )

★ අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා A කොටසට අදාළ වරණය B කොටසින් තෝරා යා කරන්න.

| A | B |
|---|---|
| 16) ශීථිලකරණය | 1. සේරිවාණිජ ජාතක කතාව |
| 17) නාට්‍ය සංගීතය | 2. පුටුව |
| 18) කදා වළලු | 3. මුහුණේ ප්‍රකාශනය |
| 19) සාත්ත්වික අභිනය | 4. ශරීරය සැහැල්ලු කිරීම |
| 20) නාට්‍යෝපකරණ | 5. ආහාර්ය අභිනය |

## 11 කොටස

★ පළමු ප්‍රශ්නය සමඟ තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.

01) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු මාෂා සහ වළහා නාට්‍යය ඇසුරින් පිළිතුරු සපයන්න.
- i. මාෂා සහ වළහා නාට්‍යයේ කතා නායිකාවගේ නම කුමක් ද? (ල.02)
- ii. මෙම නාට්‍යයේ නිර්මාණකරු නම් කරන්න. (ල.02)
- iii. මාෂා සහ වළහා නාට්‍යයේ තේමාව ලියා දක්වන්න. (ල.02)
- iv. මෙම නාට්‍යයේ ප්‍රධාන ගැටුම ඇතිවන චරිත දෙක නම් කරන්න. (ල.02)
- v. මාෂා සහ වළහා නාට්‍යයෙන් ජීවිතයට ලබාගත හැකි ආදර්ශ දෙකක් ලියන්න. (ල.02)

02)
- i. ජන ගී වර්ග දෙකක් නම් කරන්න. (ල.02)
- ii. ඔබ දන්නා ජන ගීයක් ලියන්න. (ල.03)
- iii. සරල ගීතය හා නාට්‍ය ගීතය අතර පවතින අසමානතා, කරුණු 03 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.05)

03)
- i. රංග අභ්‍යාස දෙකක් නම් කරන්න. (ල.02)
- ii. රංග අභ්‍යාස වලින් නළුවාට ලැබෙන ප්‍රයෝජන 03 ක් ලියන්න. (ල.03)
- iii. ඔබ විසින් පන්ති කාමරය තුළදී කළ රංග අභ්‍යාසයක් ලියන්න. (ල.05)

04)
- i. අභිරූපණ රංගනයක් යනු කුමක් ද? (ල.02)
- ii. අභිරූපණ රංගනයක දී යොදා ගන්නා ප්‍රධාන අභිනයන් දෙක නම් කරන්න. (ල.03)
- iii. අභිරූපණ රංගනයක දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ මොනවාදැයි විස්තර කරන්න. (ල.05)

05)
- i. අංගරචනයේ ප්‍රභේද දෙක නම් කරන්න. (ල.02)
- ii. අංගරචනා ද්‍රව්‍ය හා උපකරණ දෙක බැගින් ලියන්න. (ල.03)
- iii. අංගරචනය සිදු කිරීමේ දී අංගරචනා ශිල්පියා සැලකිලිමත් විය යුතු කරුණු 03 ක් කෙටියෙන් පහදන්න. (ල.05)

06)
- i. වේදිකා පසුතලය අයත් වන අභිනය කුමක් ද? (ල.02)
- ii. නාට්‍යයක් සඳහා පසුතල නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු 02 ක් ලියන්න. (ල.03)
- iii. ඔබ කැමති නාට්‍යයකට පසුතල නිර්මාණයක් ඇඳ පෙන්වන්න. (නාට්‍යයයේ නම සඳහන් කරන්න.) (ල.05)